Department of Education,Sabaragamuwa Province/ Weekly School

නිපුණතා මට්ටම - 7.5 වාණිජ බැංකු සපයන සේවා ව්‍යාපාරවල ක්‍රියාකාරීත්වයට ඇති කරන බලපෑම පෙන්වා දෙයි.

වාණිජ බැංකු විසින් සපයන සේවා ප්‍රධාන කොටස් 02 කි. එනම්,

1. තැන්පතු ආශ්‍රිත සේවා
2. ණය ආශ්‍රිත සේවා

මීට අමතරව වාණිජ බැංකු විසින් ව්‍යාපාරවල ක්‍රියාකාරීත්වයට බලපාන පහත සේවාවන්ද සපයනු ලබයි.

1.නියෝජිත සේවා - එනම් ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා වලදී ගනුදෙනුකරුවන්ගේ නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීමයි.

උදා - ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම

සුරැකුම්පත් මිලට ගැනීම සහ විකිණීම

විදේශ වෙළඳ කටයුතුවලදී සහය වීම

2.කල්බදු සේවා -ව්‍යාපාරිකයින්ට අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ වෙනත් වත්කම් පාවිච්චි කිරීම පිණිස මූල්‍ය පහසුකම් සපයනු ලබයි.

3. විද්‍යුත් බැංකු සේවා - එනම් අන්තර්ජාලය හරහා බැංකු කටයුතු සිදු කර ගැනීමට ගනුදෙනුකරුවන්ට පහසුකම් සැලසීමයි.

උදා - හෝම් බැන්කින් ( Home Banking)

දුරකථන බැංකු සේවා (Tele Banking)

4. මුදල් ප්‍රේෂණ කටයුතු

5. සුරක්ෂිතාගාර පහසුකම් - වාණිජ බැංකුවල ඇති විශේෂිත සේප්පු මගින් ගනුදෙනුකරුවන්ගේ වටිනා භාණ්ඩ හා ලියකියවිලි ආරක්ෂා කිරීම සිදු කරයි.

**අභ්‍යාසය - වාණිජ බැංකු සපයන සේවා ව්‍යාපාර කටයුතුවල සාර්ථකත්වයට බලපාන අන්දම පැහැදිලි කරන්න.**